# උච්ඡංග ජාතකය

තවද එක්සමයෙක්හි සංසාරචක්‍ර මර්‍ථනය කළාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් එක්තරා දනව්වාසී ස්ත්‍රියක් අරභයා මේ ජාතකය වදාළසේක. එක්සමයෙක්හි කොසොල්රට තුන් දෙනෙක් එක්තරා වනයක් සමීපයෙහි සීසානාහුය. එකල ඒ වන ඇතුළේ වසන්නාවූ සොරු මනුෂ්‍යයන් අල්වා කොල්ලකාගෙණ ගියෝය. රාජපුරුෂයෝ ඒ සොරුන් සොයා නොදක ඒ තුන්දෙනා සීසානා තැනට අවුත් තෙපි වනයෙහි හිඳ කොල්ලකාපියාදැයි සී සා ඇවිදුදැයි කියා ගම්කොල්ලෑ කෑ සොරුන් නම් මොහුයයි බැඳගෙණ අවුත් කොසොල් රජ්ජුරුවන්ට පාවාදුන්නය. එකල්හි එක් ස්ත්‍රීයක් අවුත් මට වස්ත්‍රයක් දෙවයි කිවා හඬමින් නැවත නැවත මාළිගාවට ඇවිදින්නීය. රජ්ජුරුවෝ ඒ ස්ත්‍රියගේ ශබ්දය අසා මෑට වස්ත්‍රයක් දෙවයි කීය. එබස් අසා රාජ පුරුෂයෝ වස්ත්‍රයක් ගෙණ ඒ ස්ත්‍රිය සමීපයට ගියෝය. ඒ ස්ත්‍රිය වස්ත්‍රය දැක මම මේ වස්ත්‍රය නොඉල්ලීම. පුරුෂ වස්ත්‍රය ඉල්ලීම් කිව මනුෂ්‍යයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නෝ ස්වාමීනි මේ ස්ත්‍රී වස්ත්‍රයක් උවමැනවයි නොකියයි. පුරුස වස්ත්‍රයක් උවමැනවයි කියයි. කියා රජ්ජුරුවන් ට දැන්වූහ. එකල්හි රජ්ජුරුවෝ ස්ත්‍රී සමීපයට කැඳවා ගෙන්වා ගෙණ තෝ පුරුෂ වස්ත්‍රය වුවමැනවයි කියා යාඥ්ඥා කරන්නේයැයි විචාලාහුය. එසේ ස්වාමීනි ස්ත්‍රියට වල්ලභයා නම් වස්ත්‍රයක් හා සමාන පුරුෂයා නැති කල්හි දහසක් නිල වටිනාවත් වස්ත්‍රයක් හැඳගෙණ සිටින්නාහු ස්ත්‍රි තොමෝ නග්න වූවාහු නම් වෙයි කිව. රජ්ජුරුවෝ ස්ත්‍රියගේ බස් අසා ප්‍රසන්න වූ සිත් ඇතිව මෝ තුන් දෙනෙක් පිට කවුරු වෙද්දැයි විචාලෝය. ස්වාමීනි මුන් තුන් දෙනා එක් කෙණෙක් මාගේ වල්ලභයාය. එක්කෙණෙක් මාගේ මළණුවෝය. එක්කෙණක් මාගේ පුතණුවෝය කීය. රජ්ජුරුවෝ එබස් අසා මම තිට සතුටුවෙමි කීහ. සතුටු වූ මම මුන් තුන්දෙනාගෙන් එක්කෙණෙකුන් දෙමි. කවුරුන් කැමැත්තෙහි දැයි විචාලේය. ස්වාමීනි මම ජීවත්ව වුන්නෙම් වීනම් එක් වල්ලභයෙකු ලැබෙමි.  පුතනුවන් කෙණෙකුන් ලැබෙමිය. මාගේ දෙමාපියන් මල බැවින් මලණුන් කෙණෙක් දුල්ලභයෝය. එසේ හෙයින් ස්වාමීනි මට මළනුවන් දුන මැනවයි කියෝය. රජ්ජුරුවෝ සතුටුව තුන් දෙනාම ස්ත්‍රියට පාවා දුන්නේය. මේ ස්ත්‍රිය නිසා තුන් දෙනෙක් දුකින් මිදුනාය. මේ කාරණය භික්ෂූ සංඝයා කෙරෙහි ප්‍රකාශ විය. ඉක්බිත්තෙන් එක් දවසක් භික්ෂූ සංඝයා වහන්සේ දම්සභා මණ්ඩලයෙහි රැස්ව හිඳ ඇවැත්නි එක් ස්ත්‍රියක නිසා තුන් දෙනෙක් මිදුනෝ වේදැයි ඒ ස්ත්‍රියගේ ගුණ කිය කියා උන් සේක. ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ දම්සභා මණ්ඩපයට අවුත් පනවන ලද බුද්ධාසන මස්ථකයෙහි වැඩ හිඳ මහනෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මේ නම් කතාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි මේ ස්ත්‍රී මුන් තුන් දෙනා ගැලවූවාක් දැන් මතු නොවෙයි. පෙරත් ගැලවුවයි දක්වා වදාරා ඉකුත්වත් දක්වා  වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි තුන් දෙනෙක් මහා වන සමීපයෙහි සිසාති යන සියල්ලම යට කීයන ලද්දේ හා සමාන වන්නේය. එසමයෙහි වනාහි රජ්ජුරුවන් විසින් තුන්දෙනාගෙන් කවුරුන් කැමැත්තෙහිදැයි විචාරකල්හි ස්ත්‍රිය කියන්නී ස්වාමිනි තුන්දෙනාම දෙන්ට නොපිළිවන්දැයි කිවුය. එසේය තුන් දෙනාම දෙන්ට නොපිළිවනැයි කී කල්හි ඉදින් තුන්දෙනාම දෙන්ට නුඹ වහන්සේට නොපිළිවන්වී නම් මාගේ මළනුවන් මට දුනමැනවයි කිවුය. රජ්ජුරුවන් විසින් පුත්‍රයාවත් වල්ලභයාවත් හැරගණුව තිට මළුනුන්ගෙන් ප්‍රයෝජන කිම්දැයි කී කල්හි ස්වාමිනි වල්ලභයන් හා පුත්තු නම් සුළභයෝය. මල්වූකලී ලැබගත නොහැක්කාහුයයි කියන්නී මෙසේ කිවුය. රජ්ජුරුවන් වහන්ස යම්සේ වලටවැද ඉනවටකොට දෙන්ම ස්ත්‍රීන්ට පුත්‍රයෝ නම් සුලභවන්නාහුය. ඉනතුබූපලහා සමාණයෝය. මගටබසෑ උදකලාව යන්නාවූ ස්ත්‍රියට වල්ලභයෝ නම් සුලභයෝය. දුටු කෙනෙක් ම වල්ලභ වෙති. යම්ගෙයකින් මට දෙමව්පියයෝ නැද්ද එසේ හෙයින් මම දැන් එකකුසින් ඔත් සහෝදරවූ මලනුකෙනෙකුන් යම්තෙනකින් හෙණෙම් නම් ඒ මාතෘ කුක්ෂී සංඛ්‍යාතවූ අන්‍යදේශයක් නොදකිමි එසේහෙයින් මා මලනු වන්ම දුනමැනවයි කිවුය. රජ්ජුරුවෝ  මේ ස්ත්‍රීය සැබැවක්ම කියන්නී යයි සතුටු වූ සිත් ඇතිව තුන්දෙනාම සිරගෙන් ගෙන්වා පාවාදුන්නාහුය. ඒ ස්ත්‍රී තුන්දෙනාම කැඳවාගෙණ තමන් වසනාවූ ස්ථානයටම ගියාය. ශාස්තෘවූ බුදු රජානන් වහන්සේ මහණෙනි මේ ස්ත්‍රිය මුන් තුන්දෙනා දුකින් ගැලවූවාදැන් මතු නොවෙයි පෙරත් ගැලවූමයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ උච්ඡංග ජාතකය නිමවා  වදාළසේක.

අතීතයෙහි සතරදෙනම දැන් මේ සතරදෙනමය. එසමයෙහි රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.